# හේනකින් දෙව් ලොවට - "ගමරාලයි සුදු අලියයි"




ආපු ගමන් ම පන්හිඳ වාඩි වුණෝ ලියන මේසෙ ළඟ. මොනවා හරි දෙයක් ලියන්න හිතුණාම ඊත ඒ වෙලාවෙම ලියනකල් පන්ට ඉස්පාසුවක් නෑ.

"ඒක හොඳා දැනුණ දේ දැන්ම ම ලියන එක." පින්සලත් කමිසය ගලවලා බෝල කූඩුවේ එල්ලන ගමන් කිව්වා. පැන්සල තවම ගෙදර ඇවිත් නෑ.

"තාම වැඩිය රෑ වෙලත් නෑනේ. මේක ඉක්මනට " සන්නසට" යවන්න රපායැ." පන් ලියන්න පටන් ගත්තා.

දශකයකට පමණ පෙර අප මෙරටට සංක්‍රමණය වූ කාල වකවානුව සිහිපත් වෙයි. බටහිර සංස්කෘතියකට නතුවූ රටක් ලෙස මව් බිමේදී වූ අපගේ ආකල්පය වෙනස් කරලීමට සමත් ඔහු සංස්කෘතික වටපිටාවක් මෙ'පුර ගුවන් තොටට පා තැබූ මොහොතේ පටන් ම දක්නට ලැබිණ. එදා එහිදී මා පිළිගැනීමට පැමිණි ජගත් ජේ. එදිරිසිංහ හා නිමල් අබේසේකර සහෘදයින් දෙපළගෙන් දැනගත් දේ පටන් අද වනතුරු අපගේ සමාජ උප කුලකය තුළ සිදුවන දේ විඳීමෙන් ලබන්නේ මහත් වූ තෘප්තියක්මයි.

මුල් කාලයේ මෙහි පැමිණියවුන් අතරින් යම් පිරිසක් අපගේ සිංහල සංස්කෘතික අංග මෙහි ස්ථාපිත කිරීමෙහි ලා ගත් පුරෝගාමීත්වය අගනේය. ඉන් කීපදෙනෙකුම මේ වන විට අප අතරින් වියෝ වී ඇත්තේය. පසුගිය දා අචාර්ය කරු ලියනාරච්චි මහත්මා ද අභාවප්‍රාප්ත විය. එදා ඔවුන් කළ දේ එදාටත් වඩා අද බබලන්නේ ඒවායේ ප්‍රතිඵල අද හොඳින් දැනෙන නිසාවෙනි. අපගේ සමාජ උපකුලක සීමාවෙන් ඔබ්බට යමින් මෙරට ප්‍රධාන ප්‍රවාහයට ද එක් වන අපගේ සමතුන්ගේ ප්‍රමාණය ඉහළ යමින් පවතියි. ඒ සිංහල සංස්කෘතිකාංග තුළින් ම නොවෙතත් ඒ දෙයින් උකහා ගත් දැනුම හැකියාවන්, සාරධර්ම හා විනය ඔවුන්ගේ ප්‍රගමනයට හේතු වී ඇති බව රහසක් නොවේ. අපගේ මුල් පරපුරටත් වඩා ඒ අතින් ඉදිරියෙන් සිටින්නේ දෙවන හෝ තෙවන පරපුරයි.

එදා මෙහි සංක්‍රමණය වූ අපගේ පිරිසට අපේ දේ විඳින්නට, ඉගෙන ගන්නට, ඉදිරිපත් කරන්නට තිබූ අවස්ථාවන් සීමිත විය. අද ඒ අවස්ථාව පුළුප් පාරාසයක පැතිරෙමින් ඉහළ යයි. එ නිසාවෙන් ම අපගේ සමාජ උප කුලකය තුළ ම අපගේ ම සංස්කෘතියක්, ඊට ලැදි පිරිසක් මෙන් ම හපනුන් පිරිසක් බිහිවෙමින් පවතියි. මව් බිමේ වර්තමානයේ ඇති ප්‍රවණතාවයන්ට වඩා ඉහළ මට්ටමේ කලාංග මෙරට අප අතරින් ඉදිරිපත් වීම අප සිත් අමන්දානන්දයට පත්කරවයි. අපගේ දෙවන පරපුර යහපත්, හරවත් අපේ දේට පෙම් කරමින්, ඒවායේ බැඳෙමින්, උගන ගනිමින්, ඒ දේවල යෙදෙනු දැකීමෙන් ඇති කරවන්නේ මහත් වූ සතුටකි.

රටක අනාගතය දරු පරපුරයි. අන් රටක ජීවත් වුවද අපගේ සමාජ උපකුලකයේ එහි හැදියාවේත් අනාගතය අපගේ දරු පරපුරයි. ඔවුන් මේ දේ වෙත ආශක්ත කරවා ගනිමින් පුහුණු කරවමින් ඉදිරිපත් කරවන්නේ කවුරු ද ?

කුඩා දරුවන් ලෙස අපේ දේවල් කරා දරුවන් යොමුකරවන්නේ දෙමව්පියන් විසිනි. දරුවන්ගේ කුසලතා මුලින් ම හඳුනාගන්නෝ ද ඔවුහුමයි. තම කාලය, ශ්‍රමය වැය කරමින් තමන් උපතින් ගෙන ආ දේ, උගත් දේ, හුරු කළ දේ දරුවන්ට දායාද කරමින් බෙදා හදා දෙන වැඩිහිටියන් දෙවන පිරිසයි. මේ වන විට යම් යම් දේ ඉගැන්වීමට

සුදුසුකම් ඇති හැකියාවන් ඇති ප්‍රවීණයින් පිරිසක් මේ වැඩිහිටියන් අතර සිටීම සැබවින්ම අපගේ අනාගත ළමා පරපුරේ වාසනාවකි. එනයින් එය අපේ ද වාසනාවකි.

පසුගිය දා අපට විඳින්නට ලැබුණු ළමා වේදිකා නාට්‍ය ද්විත්වය නෙතඟ කඳුළු නාවන්නට සමත් වීය. "පුංචි පැංචො 2" සහ "ගමරාළයි, සුදු අලියයි" එම නාට්‍යය දෙකයි. ඒවායේ නිර්මාණ කරුවන් නම් කුසුම්සිරි ලියනාරච්චි සහ යශෝදරා සරච්චන්ද්‍ර ප්‍රවීන නාට්‍යවේදීන් දෙපළයි. කාලයක් තිස්සේ ඔවුන් දෙපළ සෙවනේ රංගන වින්‍යාසය හදාරන බාල, තරුණ සිසු" සිසුවියන් පිරිස ගොනුකොටගෙන රසික ප්‍රේක්ෂක දන හට මුදා හල නිර්මාණකරණයේ ආශ්චර්යයකි, ඒ.

කුඩා නිමිත්තකින් විශාල දෙයක් නිර්මාණය කිරීමට ඇති හැකියාවේ පූර්වාදර්ශ වැනිය මේ නිර්මාණ. "

"විදෙස් පරිසරයක හැදී වැඩෙන ළමුන් කැළක් ද මේ ?" යන්න නාට්‍ය ද්විත්වයේ ම අප පුදුමයට පත් කළා වූ මුල් ම කාරණයයි. වෙසෙසින් ම "ගමරාලයි සුදු අලියයි" නාට්‍යය ගැමි බස් වහරම උපයෝගී කරගත් පිටපතක් විය. කුඩා දරුවාගේ පටන් තරුණ ශිල්පියා දක්වා සියළු දෙනාම තම චරිතයට බැඳ දැමූ ගැමි වදන්, යෙදුම් මෙන්ම උච්චාරණය ද ඉතාම ඉහළ මට්ටමේ පවත්වාගෙන යාමට ඔවුනට හැකි වීම පුදුම එළවන සුළු විය. කුඩා දරුවා පවා දෙබස් සියල්ල කට පාඩමින් කියමින් නියම වෙලාවට

තුන් සරණෝ සහ මිහි මව්ගේ පිහිට පතමින් "කතා හාමි" ඇතුළු පිරිස "ගමරාලයි සුදු අලියයි" නාට්‍ය ඇරඹුයේ දෙවන භාගයේදීයි. ගමරාල, ගම මහගේ වැනි චරිත "කතා හාමි" විසින් හඳුන්වා දීමේ දී කේන්ද්‍රගත විදුලි ආලෝක ධාරාවන් (ස්පොට් ලයිට්ස්) උපයෝගී කරගනිමින් කළ ඉදිරිපත් කිරීම ද අගෙයි. එම විදුලි දහරාවෙන් කේන්ද්‍රගත චරිත හාස්‍ය උපදවන සුළු රූකඩ රඟපෑමකට හුරු රඟපෑමක් ඉදිරිපත් කළහ. මෙය නාට්‍යාවසානයේ දී ද යොදා ගනිමින් අහසින් බිමට වැටෙන වුන්ගේ ඉරියව් තුන්වරන් නිවී පත්තුවන එළ මධ්‍යයේ දැක්විණ. ආලෝකකරණය කළා වූ වරුණ සාවින්ද සහ සුපින් බණ්ඩාර ද නිර්මාණයට මනා සේ බද්ධ වූ වා සේය.

චරිත සඳහා රංගන ශිල්පීන් තෝරාගැනීමේදී කුසුම්සිරි සහ යශෝදරා දක්වා ඇති සුවිශේෂී හැකියාව වෙසෙසින්ම සිහිපත් කළයුතු වෙයි. " ගමරාල", "ගම හාමිනේ", "කතා හාමි", "සුදු අලියා" වැනි චරිත ඒ අතර කැපී පෙනෙයි. ඔවුන්ගේ දක්ෂකම් මතු නොව හැඩ රුව ද ඊට දායක වී ඇත්තා සේය. මුළු පිටපතම ගායනීය බවින් යුතුව රචනා කිරීම කුසුම් සිරි ලියනාරච්චි නම් වූ රචකයා සමත්ව ඇත්තේ. එම ගායනීයත්වය උද්දීපනය කරවන ජන ගායනා හුරුව නැංවූ තනු නිර්මාණකරණයෙන් යශෝදරාවන් සිය කුසලතාවන් පෙන්වන්නීය. අපගේ බෙර පදවලින් ඒ ගායනාවල භාවයන්ද නංවන්නීය. ගැමි බව ඉහළින් ම නැංවූ අනෙක් අංගයන් වූයේ ඇඳුම් නිර්මාණ සහ වේශ නිරූපනයයි. ඇඳුම් නිර්මාණයකරණයෙහි ලා ද යශෝදරාවන් දක්වා ඇත්තේ සුවිශේෂී හැකියාවකි. මොහොතින් මොහොත වේදිකාව මත රඟ දැක්වෙන නාට්‍ය අප හටනම් අගේ ඇති රූපමය කාව්‍යයක් බඳු වී ය. ගැමි ක්‍රම නංවන හැඩ තලවලින් ද, මනා වර්ණ සංකලනයෙන් ද යුත් ඒ රූපාවලිය තුලින් නැගි සෑම ඉරියව්වක් ම චිත්‍රණය කළ හැකි ඉරියව් වීය.

දායක වූ ළමා හා තරුණ ශිල්පීන් පිළිබඳව ද කිව යුතුව ඇත්තේ ඔවුන් ලබා ඇති දියුණුව පිළිබඳවයි. ගැමි කම, ගැමි බස, ගැමි හඬ, ගැමි ගීය සරළ ලෙස සැළකුවද එහි සංකීර්ණත්වය වැටහෙන්නේ ඒ දේ තුලින් නිර්මාණ කිරීමේදීත්, ඉදිරිපත් කිරීමේදීත් ය. කුසුම්සිරි - යශෝදරා යුවල ඒ සරළ බව ආකර්ශනීය කලාවක් බවට පත් කර ගනිති. ඒ තුළින් ඉහළ තලයකට ප්‍රේක්ෂක රසිකයා ගෙන යාමට උත්සාහ කරති. හේනක සිටින ගැමි පිරිසක් වන් ප්‍රේක්ෂක අපට නියම කලා රසය විඳිය හැකි දිව්‍යමය තලයකට ගෙන යන සුදු අලි පැංචිය සේට ඔවුන් දෙපලගේ නිර්මාණ. එහෙත් වෙන අරුත් දනවන " සුදු අලියෙකු" නම් නොවේ. අපි ඒ නිර්මාණ සමඟ බැඳී යා යුතු වන්නෙමු. වෙනත් ප්‍රවණතාවලින් උද්දාමව ඒ බැඳීම අත හළ හොත් අප හට අත්වන්නේ ද ගැමි පිරිසට වූ හදියම නොවේ ද ? අප සමාජ උපකුලකය තුලින් බිහිවන මෙවන් උසස් නිර්මාණ වෙත බැඳී ඒ දෙව් ලොව වෙත යාමට සැදී පැහැදී සිටින ප්‍රේක්ෂකයින් පිරිසක් ඊට දායක වන පිරිසක් මෙන්ම ඒ දෙව් ලොව විසිතුරු කියන විචාරකයින් පිරිසක් අප හට අවශ්‍යමයි. මව් බිමෙන් ලබනා යහපත් ප්‍රවණතා ද උකහා ගනිමින් මෙහි නිර්මාණ කරුවන් හා දෙව් ලොව යන ගමනේ දී දෙවන වර ගමරාල කළා සේ අත් හැරීම්නම් කළ යුතු නොවේ. තමා අනුව එන තවත් පිරිසක්, පරම්පරා ගණනාවක් ම අගාධයට හෙළනා අනුවනකමක් වන නිසාය, ඒ.



ගමරාළ දිව්‍ය ලෝකෙ ගිය හැටි" නමින් වන අපගේ ජන කතාව ඇසුරින් කළ ප්‍රති නිර්මාණයකි " ගමරාළයි, සුදු අලියයි" ළමා නාට්‍යය. අප කවුරුත් දන්නා දෙයක් ඇසුරින් යමක් නිර්මාණය කර, ඉන් අප නෙතඟ සතුටු කඳුළු නංවන්නට හැකි වේ නම්, එය ආශ්චර්යයක් ම නො වේ ද ? අප හට සිතාගන්නට පවා අපහසු ඉදිරිපත් කරවීමක් තුළින් ම ඒ ආශ්චර්යය උපදීයි. අප හට සිතාගන්නට පවා බැරි ඉසව්වකට යම් නිර්මාණයක් අපව කැඳවා යා නම් ඒ ආශ්චර්යය උපදියි. ඉතා සරල දෙයින් අති උසස් තලයක් කරා එය අපව නංවා නම් එතැන ආශ්චර්යය උපදියි.

තම රංගනයට අවතීර්ණ වූයේ ඔවුන් ඒ චරිතවල ජීවත් වූ නිසාවෙන්මයි.

එදා - මෙදා දරුවන්ගේ ළමා කාලය සන්සන්දනාත්මකව ඉදිරිපත් කළ "පුංචි පැංචො 2" කෙටි ළමා නාට්‍යය දරුවන්ගේ සුරතල් ක්‍රියාකාරකම්, කතා බහ, ඉරියව් නිරායාසයෙන් ම රංගනයට මුහු වුණු නාට්‍යයකි. පූරක චරිතය රූපවාහිනියක් ලෙස පෙනී සිටීමද නැවුම් අදහසකි. විදෙස් ළමා වැඩසටහන්වල ඇසුර ද ලබා ගනිමින් රඟපානා දරුවන් මතු නොව, ප්‍රේක්ෂකාගාරයේ දරුවන් ද නිර්මාණය වෙත ඇද - බැඳගන්නට ගත් උත්සාහය අපූරුයි.




